**ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම - 2023 (2018-2020)**

**ස්ථානගත කිරීම සඳහා අයදුම්පත්‍රය**

**Recruitment of National Teaching Diploma holders into Sri Lanka Teacher service- 2023 (2018-2020)/**

**Application for the Placemant**

**தேசிய டிப்ளோமா கற்பித்தல் டிப்ளோமா வைத்திருப்பவர்களை இலங்கை ஆசிரியர் சேவையில் சேர்ப்பது- 2023 (2018-2020)**

## 1. පොදු උපදෙස්

1.1. මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරිමට පෙර, මෙහි සඳහන් උපදෙස් සියල්ල හොඳින් කියවා අවබෝධ කරගත යුතුය.

1.2. ඔබ විද්‍යාපීඨයට බඳවා ගැනීමට අදාළ පළාතෙහි ජාතික හා පළාත් පාසල්හි පවතින පුරප්පාඩු සඳහා ඔබට අයදුම් කළ හැකිය.

**1.3.** ස්ථානගත කිරීමේදී ඔබ බඳවා ගනු ලැබූ පළාතට ප්‍රමුඛතාව ලබාදෙමින් ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රතිඵල ලේඛනයේ සඳහන් ඔබගේ විෂයයට අදාළ කුසලතා අනුපිළිවෙල සැලකිල්ලට ගනිමින් ස්ථානගත කිරීම් සිදු කරනු ලැබේ. **අත්‍යාවශ්‍ය පුරප්පාඩු සඳහා ඔබ විසින් මනාපය පළ කර නොතිබුණද, කුසලතා ලේඛණයේ පහළම කුසලතාවයක් ලබා ඇති අයදුම්කරුවන්ගෙන් සේවා අවශ්‍යතාවය සලකා එම අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන අතරම, ඔබ අයත් පළාත තුළ  පවතින පුරප්පාඩු ප්‍රමාණවත් නොවන්නේ නම්, පුරප්පාඩු පවතින වෙනත් පළාතක් වෙත ඔබව යොමු කිරීමට ද සිදුවේ.**

1.4. යම් හෙයකින් ඔබ විද්‍යාපීඨයට බඳවා ගන්නා ලද අවස්ථාවේ ස්ථිර පදිංචි ලිපිනය මේ වන විට වෙනස් වී ඇත්නම්, ඒ සඳහා හේතු සඳහන් කොට නව ලිපිනය දත්ත පද්ධතියට ඇතුලත් කළ යුතු අතර ඔබගේ ඉල්ලීම ජාතික හැඳුනුම්පතේ පිටපතක් සහ පදිංචිය සනාථ කිරීමේ ලිපියක් සමඟ ncoe.rec23@gmail.com ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් යොමු කළ යුතුය. එසේ වුවද ඔබ ඇතුලත් කරන ලද නව ලිපිනයට අදාළ පළාතෙහි පවතින ජාතික පාසල්හි පාසල් පාදක පුරප්පාඩු සහ පළාත් පාසල්හි පුරප්පාඩු පවතින්නේ ද යන්න පරීක්ෂා කිරීමට හෝ ඔබගේ මනාප අනුපිළිවෙල අනුව පාසල් තෝරා ගැනීමට ද අවස්ථාව **හිමි නොවේ**.

1.4.1. විද්‍යාපීඨයට බඳවා ගන්නා අවස්ථාවේ ඔබගේ පදිංචියට අදාළ පළාතෙහි ජාතික හා පළාත් පාසල් පුරප්පාඩු පමණක් ඔබ වෙත ප්‍රදර්ශනය වන අතර ඔබගේ පදිංචිය වෙනස් වන්නේ නම්, එම නව පදිංචියට අදාළ පළාතෙහි පුරප්පාඩු සඳහා ඔබ අයදුම් කිරිමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා වෙනත් පළාතක් යන විකල්පය (Other Province Option) භාවිතා කරමින් ඔබට අවශ්‍ය පළාත තේරීමට හැකියාව ඇත.

1.4.2. කෙසේ වුවද කරුණු අංක 1.5හි පරිදි ඔබගේ පදිංචිය වෙනස්වීම මත නව ලිපිනයට අදාළව ඔබ ස්ථානගත කිරීමේ තීරණය අධ්‍යාපන ලේකම් සතු වේ. ස්ථානගත කිරීමේදී විද්‍යාපීඨයට බඳවා ගැනීමේ දී එම පළාතෙන් බඳවා ගන්නා ලද ශික්ෂණලාභීන් සඳහා ප්‍රමුඛතාව හිමි වන අතර ඔවුන් පාසල් සඳහා ස්ථානගත කිරීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පමණක් ඔබගේ ඉල්ලීම් අනුව ඔබ ස්ථානගත කිරීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ. ඒ අනුව, එහිදී ඔබගේ කුසතලාව සලකා බැලීමට ද අවස්ථාවක් හිමි නොවේ.

1.5. විදුහල්පතිවරුන් විසින් ලබා දෙනු ලබන පුරප්පාඩු ලිපි ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.6. ජාතික පාසල් සඳහා යොමු කරනු ලබන ශික්ෂණලාභීන්ගේ පත්වීම් මෙම අමාත්‍යාංශය මඟින්ද, පළාත් පාසල් සඳහා යොමු කරනු ලබන ශික්ෂණලාභීන්ගේ නාම ලේඛණය අදාළ පළාත සඳහා යොමු කිරීමෙන් පසුව ඔවුන්ගේ පත්වීම් අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ අමාත්‍යාංශය විසින් ඔබ වෙත නිකුත් කරනු ඇත.

1.7. පළාත් පාසල්වලට ස්ථානගත කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය පළාත් අධ්‍යාපන ලේකම් සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරනු ලබන ස්ථානගත කිරීම් සම්බන්ධයෙන් අවසාන තීරණය අධ්‍යාපන ලේකම් සතු වේ.

1.8. උපකාරක දුරකථන අංක **(Help Desk)** ඇමතීමේදී එක් එක් දුරකථන අංක වෙන්ව පවතින ආකාරය පිළිබඳව සැලකිලිමත් වෙමින් එම දුරකථන අංකයම සම්බන්ධ කර ගැනීමට සහ ඔබ විසින් පළමු ඇමතුම ලබාගෙන ප්‍රශ්නය ඉදිරිපත් කරනු ලබන දුරකතන අංකයම ඉන්පසු සෑම අවස්ථාවකම සම්බන්ධ කර ගැනීමට කාරුණික වන්න. එමෙන්ම 2023-04-21 දින සිට 23\03-04-25 දින දක්වා පෙ.ව.08.30 සිට ප.ව.04.15 තෙක් පමණක් දුරකථන ඇමතුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ.

1.9. සිංහල, දෙමළ හා ඉංග්‍රීසී භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

1.10. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2023-04-25 දින මධ්‍යම රාත්‍රී 12 වේ.

## 2. <u>පුරප්පාඩු තේරීම සඳහා උපදෙස්</u>

2.1. ඔබගේ විෂයයට සහ මාධ්‍යයට අදාළව පද්ධතියේ පවතින සමස්ථ පුරප්පාඩු ප්‍රමාණය, ජාතික පාසල්හි පාසල් පාදකව ද, පළාත් පාසල් හි පුරප්පාඩු පවතින්නේ ද යන්න පමණක් ද සඳහන් කර ඇත.

2.2. වැව්ලි අංශය හා ඒ ආශ්‍රිත පදනම මත බඳවා ගත් ශික්ෂණලාභීන්ට බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ 6.3.10 වගන්තිය පරිදි ඉල්ලුම් කල හැකි වන්නේ විද්‍යාපීඨයට බඳවා ගනු ලැබූ පළාතට අදාළ වතු අංශයේ පාසල් සඳහා පමණි. පළාත් පාසල් පුරප්පාඩුවලට අමතරව එම අයදුම්කරුවන්ට උපලේඛන 01හි සඳහන් වතු ආශ්‍රිත ජාතික පාසල්හි පුරප්පාඩු පවතින්නේ නම් පමණක් ඉල්ලුම් කිරිමට හැකියාව පවතී.

2.3. ඔබගේ විෂයයට සහ මාධ්‍යයට අදාළව ඔබ බඳවා ගනු ලැබූ පළාතේ පළාත් හෝ ජාතික පාසල්හි පුරප්පාඩු නොමැතිනම් පාසල් තෝරා ගැනීමේ මෙනුවෙහි වෙනත් පළාතක් යන විකල්පය (Option) තෝරා requests/ comments මෙනුවෙහි පළාත් 03 ක් තමන් කැමති අනුපිළිවෙලින් නම් කරන්න.

**සැලකිය යුතුයි.**

2.4. ප්‍රාථමික අධ්‍යාපනය විෂයය (සිංහල මාධ්‍යය) සහ ප්‍රාථමික අධ්‍යාපනය විෂයය (දෙමළ මාධ්‍යය) සඳහා කො/ නාලන්දා විද්‍යාලයට ස්ථානගත කරනු ලබන ඩිප්ලෝමාධාරීන් අතුරින් සිංහල මාධ්‍යය ඩිප්ලෝමාධාරීන් සිව්දෙනෙකු හා දෙමළ මාධ්‍යය ඩිප්ලෝමාධාරීන් එක් අයෙකු රිජ්වේ ආර්යා ළමා රෝහලට අනුයුක්ත කරනු ලැබේ.

2.5. එමෙන්ම විශේෂ අධ්‍යාපනය විෂයය සිංහල මාධ්‍යය සඳහා කො/ ඩී.එස්.සේනානායක ම.ම.වි. සඳහා ස්ථානගත කරනු ලබන ඩිප්ලෝමාධාරීන් අතුරින් දෙදෙනෙකු මහරගම ඔටිසම් විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා අනුයුක්ත කරනු ලැබේ.

2.6. ප්‍රදර්ශනය කරනු ලබන පාසල් පුරප්පාඩු අතර පවතින කහතුඩුව වෙනිවැල්කොළ ශිෂ්‍යයෝදා මධ්‍යස්ථානය මධ්‍යම රජය යටතේ පවතින විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානයකි.

**3. <u>වෙබ් අඩවිය පරිශීලනය කිරීමේ පොදු උපදෙස්</u>**

3.1. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය user name එක ලෙස භාවිතා කරමින් ඔබට වෙබ් අඩවියට ප්‍රවේශ (Login) වීමට අවස්ථාව හිමිවේ. එසේ  දත්ත පද්ධතියට ඇතුල් වීමට නොහැකි අය අපගේ උපකාරක දුරකථන අංක **(Help Desk)** අමතන්න.

3.2. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය user name එක ලෙස භාවිතා කරමින් වෙබ් අඩවියට ප්‍රවේශ (Login) වී ලියාපදිංචිය සම්පූර්ණ වීම සඳහා ඔබ විසින් මුරපදයක් (Password) ලබා දෙමින් නැවත ප්‍රවේශ (Login) විය යුතුය. ඔබගේ මුරපදය (Password) වෙනස් කිරීමට ඉඩ නොලැබෙන අතර එක් අයදුම්කරුවෙකුට එක් වරක් පමණක් ලියාපදිංචි වීම සඳහා අවස්ථාව හිමි වන වේ. එමෙන්ම පළමුවර  ඇතුළත් කරන ලද තොරතුරු නැවත නැවත වෙනස් කිරිමට ද අවස්ථාව හිමි නොවේ.

**3.3. ස්ථානගත කිරීම්වලින් පසු ඔබට හිමිවන පාසල හෝ පළාත කුමක් ද යන්න ලබා දෙන තෙක් ඔබගේ User Name සහ මුරපදය (Password) සිහි තබා ගැනීම අනිවාර්ය වේ. ඔබ දත්ත පද්ධතියට ලියාපදිංචි වීමෙන් පසු මුරපදය වෙනස් කිරීමට අවස්ථාව හිමි නොවේ. එමෙන්ම ඔබ දත්ත පද්ධතියට ඇතුළු වී පළමුවර තොරතරු ඇතුළත් කිරීමේ දීම නිවැරදි තොරතුරු ඇතුළත් තිරීමට කටයුතු කරන්න. තොරතුරු ඇතුළත් කර Submit කිරිමෙන් පසුව ඔබ ඇතුළත් කරන ලද තොරතුරු නැවත වෙනස් කිරිමට අවස්ථාව හිමි නොවේ.**

3.4. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව කරනු ලබන ඉල්ලීම් භාරගනු නොලැබේ.

3.5. මාර්ගගත අයදුම්පත්‍රයේ පුද්ගලික තොරතුරු සහ අභිමත සේවා ස්ථානය තේරීම යන කොටස් ඔබ විසින් සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

## 4. <u>වෙබ් අඩවිය පරිශීලනය කිරීමේ තාක්ෂණික උපදෙස්</u>

4.1. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය user name එක ලෙස භාවිතා කර, “continue” බොත්තම **Click** කර වෙබ් අඩවියට ප්‍රවේශ (Login) වීමෙන් පසු මුරපදය (Password) ලබා දිය යුතුය. ඔබ මුර පදය ලබා දීමට පෙර එහි ඇති උපදෙස් හොඳින් කියවා අවබෝධ කර ගැනීමෙන් පසු පමණක් අදාළ ස්ථානයේ (✓) සලකුණ යොදා “**Register**” බොත්තම **Click** කළ යුතුය. (ඔබේ ජාතික හැඳුනුම්පත පැරණි හැඳුනුම්පතක් නම්, “V” අකුර අනිවාර්යයෙන් Capital ඇතුලත් කරන්න)

4.2. මුරපදය ලබා දීමේදී අකුරු, අංක හෝ සංකේත 8ක්වත් ඇතුලත් විය යුතුය.

4.3. අනතුරුව තිරයේ **“**Providing new password is successful**”**යනුවෙන් දිස්වනු ඇත. **“Proceed”** බොත්තම **Click** කිරීමෙන් පසුව ඔබ නැවතත් මුල් පිටුව වෙත යොමු වනු ඇත. පෙර පරිදිම ඔබගේ ලියාපදිංචි වූ හැඳුනුම්පත් අංකය ලබා දී “continue” බොත්තම **Click** කිරීමෙන් පසු ඔබගේ ලියාපදිංචි වූ මුරපදය (Password) යොදා නැවත වාරයක් ප්‍රවේශ (Login) විය යුතුයි.

4.4. පසුව අදාළ පරිදි ඔබගේ පුද්ගලික තොරතුරු ඇතුලත් කිරීම සහ අභිමත සේවා ස්ථාන තේරීමේ කටයුතු සිදු කළ යුතුයි.

4.5. පළමුව අප සතුව පවතින ඔබේ පුද්ගලික තොරතුරුවල වෙනසක් ඇත්නම්, Edit බොත්තම **Click** කිරීමෙන් එම තොරතුරු ඔබට වෙනස් කිරීමට හැකියාව ඇත. අනතුරුව ඔබ සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යය ඩිප්ලෝමාධාරියෙකු නම් සිංහලෙන්ද ඔබ දෙමළ මාධ්‍යය ඩිප්ලෝමාධාරියෙකු නම් දෙමළෙන්ද ඔබේ නම සහ ලිපිනය ඔබ විසින් එහි සඳහන් පරිදි නැවත ඇතුළත් කළ යුතුය. (මෙම තොරතුරු ඔබගේ පත්වීම් ලිපියට ඇතුලත් කිරීම සඳහා ලබා ගන්නා බැවින්, ඔබේ නම සහ ලිපිනය නිවැරදිව ඇතුලත් කිරීමට වග බලා ගන්න.)

4.6. ඔබගේ ලිපිනය දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේ දී, එය පහත පරිදි ඇතුලත් කළ යුතුයි.

4.6.1. ඔබගේ ලිපිනය තීරු 02ක් සහිත නම්, Address Line 1 හා Address Line 5 තීරුවේ ඇතුළත් කරන්න.

4.6.2. ඔබගේ ලිපිනය තීරු 03ක් සහිත නම්, Address Line 1, Address Line 2 හා Address Line 5 තීරුවේ ඇතුළත් කරන්න.

4.6.3. ඔබගේ ලිපිනය තීරු 04ක් සහිත නම් Address Line 1, Address Line 2, Address Line 3 හා Address Line 5 තීරුවේ ඇතුළත් කරන්න.

4.6.4. ඔබගේ ලිපිනය තීරු 05ක් සහිත නම් Address Line 5ටම වන පරිදි ද ඇතුලත් කරන්න.

4.7. ඔබගේ මනාප අනුපිළිවෙල මත පුරප්පාඩු නම් කිරීමට අවස්ථාව හිමිවේ. ඒ සඳහා පුරප්පාඩු පිරවීම සඳහා වන උපදෙස් බලන්න. ඉන්පසු තොරතුරු ඇතුළත් කරන්න.

4.8. ඔබට තවදුරටත් මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් ඇත්නම්, ඔබේ මනාප අනුපිළිවෙල මත පුරප්පාඩු නම් කරනු ලබන පිටුවේ ඇති මෙනුවෙහි requests/ comments තීරුවේ සඳහන් කරන්න.

4.9. ඔබගේ ඇතුලත් කල තොරතුරු ඇතුළත් සාරාංශය පරීක්ෂා කර, ගැටලුවක් පවතී නම් උපකාර දුරකතන අංක මෙනුවෙහි ඇති අපගේ දුරකථන අංකයන් අමතන්න.

4.10. අනතුරුව **Download Icon**ය Click කර PDF ගොනුවක් ලෙස භාගත කර එම ගොනුව මුද්‍රණය කර ගන්න. අයදුම්පත් සම්පූර්ණ කිරිමේ අවසන් දිනය දක්වා ඔබට මෙම තොරතුරු PDF ගොනුවක් ලෙස මුද්‍රණය කර ගැනීමේ හැකියාව ඇත.

4.11. පසුව එහි ඇති දත්ත නිසිලෙස සම්පූර්ණ කර, එම අයදුම්පත්‍රය රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී, සාමදාන විනිශ්වයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු, ත්‍රිවිධ හමුදා අධිකාරියලත් නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු ලවා සහතික කරවාගෙන, **sas.te@emis.moe.gov.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට ...................... දින හෝ ඊට පෙර ලැබෙනසේ යොමු කිරීම අනිවාර්ය වේ.

4.12. විද්‍යුත් තැපැල් පණිවිඩයේ විෂයය (Email Subject) **සඳහා අයදුම්කරුගේ මුලකුරු සමඟ නම, විෂයය සහ මාධ්‍යය** අනිවාර්යයෙන් සඳහන් කරන්න.

4.13. එම අයදුම්පත ඔබ සතුව තබා ගැනීම ඔබට පසුවට වැදගත් වනු ඇත.

5. <u>උපකාරක දුරකතන අංක **(Help Desk)**</u>

011-2785634 - සිංහල හා ඉංග්‍රීසී මාධ්‍යය අයදුම්කරුවන්

011-2786749 - දෙමළ මාධ්‍යය අයදුම්කරුවන්

**උපලේඛන 01**

| අනු අංකය | පාසල් සංගණන අංකය | පාසලේ නම | පළාත |
|---|---|---|---|
| 01 | 2180 | මතුගම සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාලය | බස්නාහිර |
| 02 | 3256 | මහ/රජවැල්ල හින්දු ජාතික පාසල | මධ්‍යම |
| 03 | 3617 | මහ/පුස්සැල්ලාව හින්දු ජාතික පාසල | මධ්‍යම |
| 04 | 4262 | මා/පාක්කියම් ජාතික පාසල | මධ්‍යම |
| 05 | 4266 | මා/හින්දු ජාතික පාසල | මධ්‍යම |
| 06 | 5035 | නු/ශාන්ත ග්‍රේබියෙල් බාලිකා විද්‍යාලය | මධ්‍යම |
| 07 | 21125 | බ/පස්සර මධ්‍ය මහා විද්‍යාලය | ඌව |
| 08 | 21464 | බ/සරස්වතී මධ්‍ය මහා විද්‍යාලය | ඌව |
| 09 | 23060 | ර/ෆර්ගියුසන් උසස් විද්‍යාලය | සබරගමුව |
| 10 | 23068 | ර/ජේසු බිලින්ඳාගේ කන්‍යාරාමය | සබරගමුව |
| 11 | 23544 | රක්වාන ශාන්ත ජෝන් දෙමළ මහා විද්‍යාලය | සබරගමුව |